# කඩුවෙල මහා නගර සභාව
# கடுவெல மாநகர சபை
# Kaduwela Municipal Council

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My Number | KMC/05/E – 07/02/102/2024 | ඔබේ අංකය<br>உங்கள் இலக்கம்<br>Your Number | ..................... | දිනය<br>திகதி<br>Date | 2023.10.31 |

.......................................................

.......................................................

.......................................................

**සමූහ රථ වාහන රක්ෂණාවරණයක් සඳහා මිල ගණන් ලබා ගැනීම - 2024**

මෙහි අමුණා ඇති උපලේඛනයේ සඳහන් වාහන සඳහා මෙහි මතු දැක්වෙන කොන්දේසි වලට යටත්ව මෙම සභාව මගින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි වෙළඳපොල තුල ක්‍රියාත්මක ආයතන මගින් 2023 .11 .01 දින සිට 2023.11.20 දින දක්වා මිල ගණන් කැඳවනු ලැබේ.

02.ආපසු නොගෙවනු ලබන රු. 4000.00 ක ගාස්තුවක් සහ ආපසු ගෙවනු ලබන රු. 20000.00 ක ටෙන්ඩර් ගාස්තුවක් ද කඩුවෙල මහා නගර සභාවෙහි ප්‍රධාන කාර්යාලයේ මුදල් කවුළුව වෙත ගෙවා නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවෙන් ටෙන්ඩර් අයදුම්පත් ලබා ගත යුතුය.

03.එසේම ඔබගේ මිල ගණන් අනුව මෙහි ඇමුණුමෙහි ඇති උපලේඛනය සම්පූර්ණ කර 2023.11.20 වන දින පෙ.ව. 10.00 ට ප්‍රථම "නාගරික කොමසාරිස් , කඩුවෙල මහා නගර සභාව,කඩුවෙල" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල මගින් එවීම හෝ අතින් ගෙනවිත් කඩුවෙල මහා නගර සභාවේ නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම කල යුතුය. එදිනම පෙ.ව.10.15 ට මිල ගණන් විවෘත කිරීම සිදු කරනු ලබයි.

04. මිල ගණන් බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ **"රථ වාහන රක්ෂණ කිරීම - 2024 සඳහා මිල ගණන්"** යනුවෙන් සඳහන් කළ යුතු අතර, නියමිත දින නියමිත වේලාවට පසුව ලැබෙන මිල ගණන් විවෘත නොකර ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේම තැපැල්දී අස්ථානගත වන මිල ගණන් සම්බන්ධයෙන් මෙම සභාව වග කියනු නොලැබේ.

05. එසේම සභාව සතු ටේලර් රථ සඳහා තෙවන පාර්ශවීය රක්ෂණ සහතිකයක් ප්‍රමාණවත් වන අතර ටේලර් රථ වෙනුවෙන් ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා උපලේඛනයේ අංක 04 සහ 05 භාවිතා කරන්න.

06. වැඩිදුරටත් විස්තර අවශ්‍ය වන්නේ නම් සතියේ දින කාර්යාල වේලාව තුළ 0112 – 571200 දුරකතන අංකයෙන් නාගරික ඉංජිනේරු අංශයෙන් ලබාගත හැකිය.


| | | නගරාධිපති<br>முதல்வர்<br>Mayor | නාගරික කොමසාරිස්<br>மாநகர ஆணையாளர்<br>Commissioner | නාගරික ලේකම්<br>மாநகர செயலாளர்<br>Secretary | ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office |
|---|---|---|---|---|---|
| දුරකථන අංකය | தொலை பேசி Telephone | 011-2539832 | 011-2548491 | 011-2539831 | 011-2571200 |
| ෆැක්ස් | பெக்ஸ் Fax | 011-2548493 | 011-2548492 | 011-2548996 | 011-2548996 |
| ඊ මේල් | மின்னஞ்சல் E-Mail | mayorkaduwelamc@gmail.com | mckaduwela@gmail.com | ms.kadumc@gmail.com | |

කොන්දේසි :-

01.ඔබ විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් වල අපහැදිලිවීම් හෝ වෙනස්කිරීම් පවතීනම් ඒ මත කෙටි අත්සන් යොදා සනාථ කර නොමැති නම් ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

02. ඔබ විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන්හි පූර්ණ රක්ෂණාවරණයට අයත්වන සියලු පහසුකම් පැහැදිළිව දැක්විය යුතුය. ( ස්වාභාවික විපත් සහ කැරලි කෝලාහල රක්ෂණාවරණය ආදී අනෙකුත් රක්ෂණාවරණයන්ද සඳහන් කල යුතුය.)

03. තෙවන පාර්ශවය සඳහා රු.500,000/- ක අවම රක්ෂණාවරණයක් සිදු විය යුතුය.

04. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් 2024.01.01 සිට 2024.12.31 දින දක්වා කාලය සඳහා වලංගු වන සේ ඉදිරිපත් කල යුතුය.

05. වාහන පරීක්ෂා කිරීම ,ප්‍රතිලාභ ගෙවීම ආදී සියළු කටයුතු සෘජුවම ඔබ ආයතනයේ මැදිහත් වීම මත සිදු විය යුතු අතර, මේ සඳහා කිසිදු රක්ෂණ නියෝජිතයෙකු සම්බන්ධ නොකල යුතුය.

06. කිසියම් අනතුරක්/ සිද්ධියක් සිදු වූ වහාම අදාළ අලාභය ගණනය කර හානිපූර්ණය එම ස්ථානයේදීම ගෙවීමේ ක්‍රමය (ON THE SPOT ) තිබේ ද යන්න පිළිබඳව සඳහන් කල යුතුය.

07. හානිපූර්ණයක් කිරීම සඳහා ගතවන අවම කාලය දිනවලින් සඳහන් කල යුතුය. ( සියළුම අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමෙන් පසු)

08. හිමිකම් නොපෑම මත ලබා දෙන ප්‍රතිලාභය (NO CLAIM BONUS) ප්‍රතිශතය එක් එක් වාහන අංක ඉදිරියෙන් දැක්විය යුතුය.

09. ඔබ ආයතනය විසින් රක්ෂණ සේවා සපයනු ලබන රාජ්‍ය/අර්ධ රාජ්‍ය /පෞද්ගලික ආයතනයන් පිළිබඳ විස්තර පැහැදිළිව ඉදිරිපත් කල යුතුය.

10. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිළ ගණන් බදු සහිත සහ බදු රහිත වශයෙන් වෙන් වෙන්ව දැක්විය යුතුය.

......................................

දිල්රුක්ෂි ගමගේ,
නාගරික කොමසාරිස් සහ
බලතල ,කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරක නිලධාරි.